**ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2014**

**-------------------------------------------------------------------------**

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 වැනි දිනට ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම් සහ වගකීම්ද ආදායම් හා වියදම්ද විශේෂිත අවස්ථාවකදී හැරුණු විට හිලව් කළ නොහැකි වුවත් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු. 36,220,884 ක් වූ ආදායමෙන් රු.14,694,860 ක් වූ වියදම් හිලව් කර ශුද්ධ ශේෂය රු. 20,383,184 ක් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

(ආ) එක් එක් ආදායම් ප්‍රභවය ප්‍රමාණාත්මක වන විට මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව හෙළිදරව් කළ යුතු වුවත් උසස් සහතිකපත්‍ර පාඨමාලාවෙන් ලද රු.1,229,401 ක ආදායම කාර්මික පාඨමාලා ආදායමෙහිද, වෛද්‍ය පරීක්ෂණ වෙනුවෙන් ලද රු.1,424,000 ක ආදායම සහ ජාතික වෘත්තීය කුසලතා පාඨමාලා ප්‍රමිති වැඩසටහන් සඳහා රු.1,474,533 ක ආදායම් වෙනත් ගිවිසුම්ගත කාර්යභාර වලින් ලද ආදායමෙහිද දක්වා තිබුණි.

(ඇ) ආයතනය විසින් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා 2010 වර්ෂයේ සිට ලැබුණ රු.16,151,975 ක මුදලක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය කර ගත යුතු ආයතනය විසින් දරන ලද රු.3,115,432 ක් වූ ප්‍රාග්ධන වියදම් සහ රු.2,387,532 ක් වූ පුනරාවර්තන වියදම් ලැබිය යුතු මුදලක් වශයෙන් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු. 5,813,827 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම රු.3,728,741 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගෙන තිබූ අතර රු.10,000 ක් වූ සුළු මුදල් ශේෂය අත්හැරී තිබුණි. එහෙයින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

**2.3 නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 18 වගන්තිය | ආයතනය විසින් ආයතනයේ වැඩකටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කර අදාල වර්ෂයට පසුව එළඹෙන වර්ෂය ඉකුත් වීමට පෙරාතුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2013 වර්ෂය සඳහා වූ එම වාර්තාව විගණන දිනය දක්වාම සකස් කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | ආයතනයේ අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ආයෝජනය කර ආදායම් ඉපැයීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ මුදල් හා බැංකු ශේෂය රු.3,032,877 ක් විය. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

ආයතනය විසින් දිරි දීමනා ගෙවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩලය වෙත රු. 397,602 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,441,777 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු. 12,722,049 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,719,728 ක ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. අතිරික්තය වැඩිවීම කෙරෙහි රජයේ දායකය රු. 8,990,316 කින් හා මෙහෙයුම් ආදායම රු. 2,270,588 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවීම සඳහා පාදක කර ගත යුතු 2011 අප්‍රේල් 29 දිනැති අංක PED 58 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.2 ඡේදයට අනුව මෙම ආයතනය අදාල වර්ගීකරණය තුලට ඇතුලත් කර නොතිබුණි. එසේ තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවීමට අදාල විධිවිධාන පැහැදිලි කරගෙන නොතිබුණි.

(ආ) දැනට ආයතනය පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලේ අයිතිය ආයතනය වෙත පවරා ගැනීම හෝ කුළී ගෙවීම පිළිබඳව අමාත්‍යාංශය සමඟ ගිවිසුමකටද එළැඹ නොතිබුණි.

(ඇ) ආයතනය විසින් සහතික පත්‍ර පාඨමාලා 03ක් පවත්වා සහතික පත්‍ර ප්‍රදානය කළ නමුත් එම පාඨමාලාවන් අයදුම් කළ සහ සාර්ථක ලෙස නිමකර සහතික පත්‍ර හිමිකරගත් අයගේ විස්තර ඇතුලත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. මේ නිසා පාඨමාලාවන් නිමකර සහතික පත්‍ර හිමිකරගත් අයගේ සහතික පත්‍ර තහවුරු කිරීම් ගැටළුකාරී වී තිබුණි.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ධූර කාලය 2015 මාර්තු 21 දින අවසන් වන නමුත් එම සාමාජිකයින් 2014 නොවැම්බර් 25 දිනෙන් පසුව පාලක සභා රැස්වීම්වලට සහභාගී වී නොතිබුණි.

**4.2 කාර්යමණ්ඩල පරිපාලනය**

ආයතනයේ අනුමත කාර්යමණ්ඩල හා පුරප්පාඩු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 13 ක අනුමත සේවක සංඛ්‍යාව 25 ක් වූ අතර දැනට සිටින සේවක සංඛ්‍යාව 15 කි. මේ අනුව පවතින පුරප්පාඩු 10 විගණන දිනය දක්වාම පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් පසුගිය වර්ෂවලදීද විගණනයෙන් පෙන්වා දී තිබූ අතර ආයතනයේ ඇතැම් අංශවල කටයුතු මෙම පුරප්පාඩු නොපිරවීම නිසා අක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. අත්‍යාවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකිරීම තුලින් ආයතනයේ අරමුණු නිසි පරිදි ඉටුකරගැනීමේ දුෂ්කරතාවයන් සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මඟින් භෞතික ඉලක්ක පමණක් ඇතුලත් කර තිබූ අතර මූල්‍ය ඉලක්ක ලබා දී නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

ආයතනයේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විචලනය සියයට 31 සිට සියයට 515 දක්වා වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය ලේඛනමය පාලනය